**රේගු නිලධාරීන්ගේ තයාග අරමුදල - 2015**

----------------------------------------------------

රේගු නිලධාරීන්ගේ තයාග අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

2.1 **මතය**

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ තයාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එක් නිලධාරියෙකු සඳහා 2008 වසරේදී ගෙවා තිබූ රු. 85,000,000 කට වැඩි ත්‍යාග මුදලකට විරුද්ධව ලැබී තිබුණු මහජන පැමිණිල්ලක් සම්බන්ධයෙන්ද තවත් නිලධාරීන් 05 දෙනෙකුට 2015 වර්ෂයේදී ගෙවා තිබූ රු. 90,389,735 කට වැඩි ත්‍යාග මුදල් ගෙවීමක් සම්බන්ධයෙන් ද. වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි සිද්ධි ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවුණි.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ කටයුතු වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන ගොස් තිබූ පොත් සහ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් තිබූ පොත් අතර 2015 දෙසැම්බර් 31 දිනට නිරීක්ෂණය වූ රු.9,529,435 ක වෙනසක් විය.

(ආ) ත්‍යාග අරමුදල් ගෙවීම් සඳහා වූ අංක 118 දරන දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛයේ විධිවිධාන අනුව එම අරමුදලේ උපඅරමුදල් 03 කට සමාලෝචිත වර්ෂය තුළ බැරවිය යුතුව පැවති මුදල් හා තථ්‍ය ලෙස බැර කර තිබූ මුදල් අතර රු.868,786 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ සංචිත නිලධාරීන්ට ගෙවිය යුතු ත්‍යාග වටිනාකම ලෙස රු.135,238,202 ක් දැක්වුවද ශේෂ පත්‍රය තුළ, ඒ සඳහා උපචිත කර තිබුණේ රු.134,340,019 ක් වීම හේතුවෙන් රු.898,183 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

2015 දෙසැම්බර් 31 දින වන විට, නිලධාරින් විසින් ලබානොගත් එකතුව රු.43,900,183 ක් වූ ත්‍යාග මුදල් වර්ෂ ගණනාවක සිට සමුච්චනය වෙමින් පැවති ඒවා වුවද, එම මුදල් විධිමත් පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 4.1 (ඇ) ප්‍රකාරව අනුමත කරන ලද අයවැය ලේඛනය තුළ විෂ මත්ද්‍රව්‍ය අරමුදලේ ගෙවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණද, සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදලින් රු.34,400,000 ක වියදම් දරා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.63,330,362 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.36,526,769 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,803,593 කින් හෙවත් සියයට 73 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.223,450,785 කින් හෙවත් සියයට 16.75 කින් වැඩි වී තිබුණද, මුළු ආදායම රු.250,254,378 කින් හෙවත් සියයට 18.26 කින් වැඩි වීම නිසා මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇති වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1** **කාර්යසාධනය**

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු ආඥා පනතේ 153 (2) (ආ) ප්‍රකාරව විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 50 කට සමාන මුදල් ප්‍රමාණයක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කරනු ලබන අතර රේගු බදු වංචාවන් අනාවරණය කරගැනීම, පාලනය කිරීම හා වැළැක්වීම වැනි ඇරමුණු පෙරදැරි කරගෙන මෙම අරමුදල පිහිටුවා තිබුණි.

පසුගිය වර්ෂ කිපයක දත්ත පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ රේගු බදු වංචාවන්ගේ සැළකිය යුතු පාලනයක් හෝ අඩුවීමක් රේගු ත්‍යාග යෝජනා ක්‍රමය මගින් ඉටු වී ඇතිද යන්න ප්‍රශ්ණගත කරුණක් බවයි.

(ආ) ඉකුත් වර්ෂ 05 ක කාලය තුල පැවැත්වූ රේගු විමර්ශන සංඛ්‍යාව හා ත්‍යාග ගෙවීම සඳහා අරමුදලට වෙන්කල මුදල් වටිනාකම පිළිබඳ සමහර විස්තර පහත දැක්වේ.

| **වර්ෂය** | **විමර්ශන සංඛ්‍යාව** | **අරමුදලට වෙන්කල මුදල** |
|---|---|---|
| | | රු. |
| 2011 | 128 | 737,048,629 |
| 2012 | 183 | 950,983,391 |
| 2013 | 200 | 1,447,375,243 |
| 2014 | 258 | 1,323,251,133 |
| 2015 | 296 | 1,545,350,576 |

ඉහත දත්ත පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වන්නේ වාර්ෂිකව සිදුවන රේගු බදු වංචාවන්ගේ වැඩිවීමක් සිදුවී ඇති බවත්, වැඩ නිම කර ඇති රේගු විමර්ශන සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බවත් හා නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල්වල මූල්‍ය වටිනාකම සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බවත්ය. ඒ අනුව අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම යෝජනා ක්‍රමය කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.

(ඇ) රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේ දී අහිමි වූ රජයේ බදු ආදායමද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීම හේතුවෙන් නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල්වල වටිනාකම ඉහල යාමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදලේද වටිනාකම ඉහල යාමක් නිරීක්ෂණය වීය.

(ඈ) රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව නිකුත්කර ඇති දෙපාර්තමේන්තු නියෝග අංක 118 මගින් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර ත්‍යාග මුදල් බෙදා හැරීමේ යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබූ අතර, 2012, 2013, 2014 හා 2015 වර්ෂවල දී පිළිවෙලින් රු.822,569,372 ක්, රු.1,268,050,168 ක්, රු.1,142,901,944 ක් හා රු.1,355,988,378 ක් වශයෙන් එකතුව රු.4,589,509,862 ක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණි. මින් රු.4,099,362,874 ක් හෙවත් සියයට 89.32 ක්ම නිලධාරීන් වෙත ගෙවා තිබුණි.

(ඉ) වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇතිවී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය සිදුවී නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුල අරමුදලට වෙන්වී ඇති මුදල රු.මිලියන 1,545 ක් වුවද, ත්‍යාග ලෙස ගෙවා ඇති මුදල රු.මිලියන 1,590 ක් විය. වෙනස වූ රු.මිලියන 45 ක මුදල ත්‍යාග අරමුදලේ උප අරමුදල් දෙකක් මගින් ගෙවා තිබුණි.

(උ) රේගු ත්‍යාග අරමුදලින් සියයට 1 ක් වෙන් කරන විෂ මත්ද්‍රව්‍ය අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු.15,491,105 ක් බැර කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතුවල නිරතවූ නිලධාරින් සඳහා රු.34,400,000 ක් ගෙවා තිබුණි. එය ඉකුත් වර්ෂයේ වියදම වූ රු.7,624,452 ක මුදල සමඟ සැසඳීමේදී රු.26,775,548 කින් හෙවත් සියයට 351 කින් වැඩිවීමකි. ඒ අනුව මත්ද්‍රව්‍ය විමර්ශන සඳහා ත්‍යාග අරමුදලෙන් වෙන් කෙරෙන වටිනාකම වැඩි කිරීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුල විෂ මත්ද්‍රව්‍ය වැටලීම් 12 ක් සිදු කර තිබුණ අතර එමගින් විෂ මත්ද්‍රව්‍ය පාලනය සඳහා සැලකිය යුතු පිටුවහලක් ලැබී ඇති බවද, විගණනයේදී නිරීක්ෂණය විය.

(ඌ) රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට රැස් කරන ආදායමින් සියයට 1.485 ක ප්‍රතිශතයක් බැර කෙරෙන ඉන්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේ දී රු.45,112,577 ක් බැරකර තිබුණි. එම අරමුදල පිහිටුවීමේ අරමුණු ලෙස රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම බව වාර්තා වී තිබුණද, සමාලෝචිත වර්ෂය තුල එම අරමුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේම රේගු විමර්ශන කටයුතුවලින් ලැබෙන ආදායම ත්‍යාග අරමුදලට බැර කර ත්‍යාග මුදල් ගෙවා තිබුණද, එම විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශීර්ෂය යටතේ දරා තිබුණි.

(එ) ත්‍යාග අරමුදලේ උප ත්‍යාග අරමුදලක් වන සියයට 2.5 ත්‍යාග අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු.23,068,449 ක් බැර කර තිබුණු අතර එම අරමුදලෙන් නිලධාරීන්ට ගෙවා තිබුණු මුදල රු.23,392,357 ක් විය. නිලධාරීන් විසින් සිදු කරනු ලබන ඇතැම් ක්‍රියාකාරකම් දණ්ඩන පැනවිය හැකි රේගු විමර්ශන නොවන අවස්ථාවලදී අදාල නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවීම සඳහා මෙම අරමුදල යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

1996 වර්ෂයේ සිට 2002 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකා රේගුවේ පවත්වා ගෙන ගොස් තිබූ රු.109,400,000 ක් වටිනා බැඳුම්කර වගකීමක් 2014 ජනවාරි මස වන විටත් ශ්‍රී ලංකා රේගුව විසින් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, පසුව මේ පිළිබඳව සිදු කරන ලද රේගු විමර්ශනයකින් අනතුරුව රු.57,736,913 ක මුදලක් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවා තිබුණ අතර එම මුදලින් රු.28,868,456 ක් ශ්‍රී ලංකා රේගුව විසින් රේගු නිලධාරීන්ට ත්‍යාග මුදල් ලෙස ගෙවා තිබුණි.

රාජ්‍ය ආයතනයක් වන ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් අයවිය යුතු බැඳුම්කර මුදලින් කොටසක් අයකර ගෙන නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවීම මතභේදයට තුඩු දෙන කරුණක් වූ අතර අදාල මුදල් අයකර ගැනීම ශ්‍රී ලංකා රේගුවේ වගකීමක් බව නිරීක්ෂණය විය. එසේම ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකා රේගුවට ගෙවා තිබූ මෙම මුදල භාණ්ඩාගාරය විසින් ඛණිජ තෙල් සංස්ථාව වෙත ප්‍රතිපූර්ණය කිරීමටද එකඟවී ඇති බව ලිපිලේඛන අනුව තවදුරටත් නිරීක්ෂණය විය. තවද මුළු බැඳුම්කර මුදල වූ රු.109,400,000 ක මුදලින් අතහැර තිබූ රු.51,663,087 ක බැඳුම්කර මුදල සම්බන්ධයෙන්ද ශ්‍රී ලංකා රේගුව විසින් විධිමත් පියවර ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 4.3 වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණනය වෙත

ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2016 මැයි 05 දිනදීය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

---------------------------------

අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 40 සිට 144 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ත්‍යාග ගෙවීම් | ත්‍යාග මුදල් ගෙවීම සඳහා අදාල ලිපිගොනු ගිණුම් අංශය වෙත ලැබී ඇති දින වකවානු සහ අදාල ත්‍යාග ලැයිස්තු සඳහා මුදල් ලැබුණු දින වකවානු යනාදිය සඳහන් ලේඛනයක් ගිණුම් අංශය පවත්වා නොගැනීම හේතුවෙන් ත්‍යාග ගෙවීමේ ක්‍රියාවලිය අක්‍රමවත් වී තිබීම. |
| (ආ) | ත්‍යාග ගණනය කිරීම | ත්‍යාග මුදල් ගණනය කිරීමේදී රජයේ බදු ආදායම සුරක්ෂිත වන ලෙසටත්, රේගු බදු වංචාවන්වල පාලනයක් ඇති වන ලෙසටත් හා රේගු බදු වංචාවන්වල නිරත පාර්ශවයන්ට උපරිම අවාසියක් ලැබෙන ලෙසටත් වූ ප්‍රායෝගික ගණනය කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම. |
| (ඇ) | ගිණුම්කරණය | - ක්‍රමවත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වාගෙන නොතිබූ අතර ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබීම.<br>- වියදම් නිශ්චිතව හඳුනාගෙන වර්ගීකරණය කර නොතිබීම. |